# අයවැය කථාව - 2023

# வரவு செலவுத்திட்ட உரை - 2023

# Budget Speech – 2023

රනිල් වික්‍රමසිංහ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය
**ரணில் விக்ரமசிங்ஹ, நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சர்**
Ranil Wickremesingha, Minister of Finance, Economic Stabilization and National Policies

# 77 වන අයවැය කථාව

# 2023

**2022** නොවැම්බර් **14** දින

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## 2023 අයවැය කතාව

## ශ්‍රී ලංකාව - නව ආරම්භයක් කරා

ප්‍රවේශය

ගරු කථානායකතුමනි,

ගෙවුණු මාස කීපය තුළ අප ගත් වෙහෙසකර සහ දුෂ්කර ක්‍රියා පිළිවෙත් නිසා, ආර්ථික අගාධයෙන් ගොඩ ඒමේ මාර්ගයට ආලෝකයක් වැටී තියෙනවා. දවස් ගණන් පෝලිම්වල හිටපු, තැන් තැන්වල පදිංචිවෙලා අරගල කරපු යුගය පසුකර, දුක්කරදර යම් ප්‍රමාණයකට සමනය වුණු සැනසිලිදායක යුගයකට අපි ළඟාවෙලා තියෙනවා.

මේ වනවිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා පැවැත්වෙනවා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව චීනය සහ ඉන්දියාව සහ අනෙකුත් ණය දෙන රටවල් සමඟ අදහස් හුවමාරු කරගන්නවා. මේ සාකච්ඡාවලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වෙතැයි අපට විශ්වාසයක් තියෙනවා.

පසුගිය කාලය තුළ අප අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා උද්ධමනය යම් ප්‍රමාණයකින් පාලනය කර ගන්න පුළුවන් වුණා. ඒ වගේම රුපියල ශක්තිමත් වෙමින් පවතිනවා. මේ තත්වය දිගින් දිගටම පවත්වාගෙන යෑම අපේ බලාපොරොත්තුවයි. තව දුරටත් මේ පියවර ඔස්සේම ඉදිරියට යෑමෙන්, ලබන අවුරුද්ද ඇතුළත ආර්ථික ස්ථාවරත්වය තහවුරු කරගැනීමට අපට පුළුවන්කම ලැබෙන බව මට විශ්වාසයි.

නමුත් එතැනින් සෑහීමකට පත්වෙන්නට අපට බැහැ. අප අලුත් ගමනක් ආරම්භ කළ යුතුයි.

පසුගිය අගෝස්තු මාසයේ අතුරු අයවැය යෝජනා ඉදිරිපත් කරමින්, මම සඳහන් කළේ මෙතෙක් අපේ රටේ පැවති ආර්ථික රටාව වෙනස් කරලීම සඳහා මූලික පදනම සකස් කිරීම අතුරු අයවැය යෝජනාවල අරමුණ බවයි. අද ඉදිරිපත් කරන 2023 අයවැය යෝජනා ඔස්සේ නව ලෝකයට ගැලපෙන නව ආර්ථිකයක් ගොඩ නැංවීමේ ක්‍රියාවලිය ආරම්භ කරන බවත්, මම එහිදී සඳහන් කළා.

නිදහසින් පසුව අවුරුදු හැත්තෑපහක් ගෙවී යන අවස්ථාවේ, අපේ රට පත්ව ඇති තත්වය ගැන අපට සෑහීමකට පත්වෙන්න පුළුවන්ද? අපට වැරදුණේ කොතැනද? අප වරද්දා ගත්තේ කොතැනද?

මම ඉපැදුණේ නිදහස් ලංකාවෙ. ලංකාවට නිදහස ලැබිලා අවුරුද්දකට පස්සෙ. ඒ වෙනකොට ආසියාවේ සංවර්ධිතම ආර්ථිකය තිබුණේ ජපානයේ. ලංකාවේ අපි හිටියේ දෙවැනි තැන කියන එක ප්‍රසිද්ධ කරුණක්. අද ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,815 යි. ජපානයේ ඇමෙරිකානු ඩොලර් 39,285 යි.

මගේ තවත් පුද්ගලික අත්දැකීමක් මට සිහිපත් වෙනවා. 1991 අවුරුද්දේ, මම කර්මාන්ත ඇමති ධූරය දරන අවදියේ වියට්නාමයේ කර්මාන්ත ඇමතිතුමා ලංකාවට ආවා. අපේ විවෘත ආර්ථික ක්‍රමය පිළිබඳවත්, කාර්මීකරණ උපාය මාර්ග පිළිබඳවත් අධ්‍යයනය කරන්නට එතුමාට අවශ්‍ය වී තිබුණා. මම එතුමාව දැනුවත්

කළා. මහකොළඹ ආර්ථික කොමිසමේ නිලධාරීන් සමගත් සාකච්ඡා කරන්නට එතුමාට අවස්ථාව සලසා දුන්නා. 1995 වසර වන විට ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.1 යි. වියට්නාමයේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.3 යි. වියට්නාම් ඇමතිතුමා අපේ ක්‍රමවේදයන් හදාරා තමන්ගෙ රටට ගියා. අද තත්වය මොකද්ද? 2021 වසරේ දී වියට්නාමයේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 109.4 යි. ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 3.1 යි.

අපි ආපසු හැරී බලමු. පාට පාට දේශපාලන කණ්ණාඩි ගලවා බලමු. අපට වැරදුනේ ඇයි? අපට වැරදුණේ කොතැනද? අපට වැරදුණාද? එහෙමත් නැත්නම් අපි වරද්දා ගත්තාද?

අද අපේ රට ආදායම් ලබන ප්‍රධාන ක්ෂේත්‍ර කීපයක් තියෙනවා. එකක් වැවිලි ආර්ථිකය. ඊළඟට නිදහස් වෙළඳ කලාප. ඇඟළුම් කර්මාන්ත. සංචාරක ව්‍යාපාරය සහ විදේශ රැකියා. එහෙම බලපුවාම නිදහසින් පසුව, රටට විදේශ ආදායම් ලබා ගත හැකි ප්‍රධාන මාර්ග කීපයක් විතරයි අපට නිර්මාණය කරගන්නට පුළුවන් වෙලා තියෙන්නෙ. එතැනින් එහාට මහා පරිමාණයේ විදේශ ආදායම් ලබන ක්ෂේත්‍රයන් අපට තවමත් නිර්මාණය කරගන්නට බැරිවුණේ ඇයි? මෙය අප විමසිල්ලෙන් සිතා බැලිය යුතු කරුණක්.

පසුගිය කාලය පුරා අපි උද්දාමයට පත්වුණේ, සතුටු වුණේ, අනාගතයට වැඩදායක කාරණා වෙනුවෙන්ද නැත්නම්, ඒ ඒ අවස්ථාවන්හි මතුපිටින් දකින්නට ඇති කාරණා වෙනුවෙන්ද? සාර්ථක පුද්ගලික ව්‍යාපාර ජනසතු කරද්දී ජනතාව සතුටු වුණා. නොමිලේ හාල් දෙද්දී ජනතාව සතුටු වුණා. එවැනි තීරණ ගත් ආණ්ඩු තාවකාලිකව ජනප්‍රිය වුණා.

මේ නිසා පාරට විදුලි ලාම්පුවක් සවි කිරීමෙන් අපි සෑහීමකට පත්වුණා. හැබැයි විදුලි උත්පාදනය වැඩි කිරීම ගැන අපි ගැඹුරු ලෙස කල්පනා කළේ නෑ.

ඇත්තෙන්ම රටක දීර්ඝ කාලීන සංවර්ධනයට පදනම් වෙන්නේ ජනප්‍රිය තීන්දුද? එහෙමත් නැත්නම් නිවැරදි තීන්දු ද? අපේ රටේ බොහෝ අවස්ථාවල සිදුවුණේ නිවැරදි තීන්දු වෙනුවට ජනප්‍රිය තීන්දු ගැනීමයි. අදත් බොහෝ අය උත්සාහ ගන්නේ ජනප්‍රිය තීන්දු ගැනීමටයි.

මේ ජනප්‍රිය තීන්දු සම්ප්‍රදායේ ප්‍රතිඵලය වුණේ මොකද්ද? සහන ආර්ථිකයක්, සහන මානසිකත්වයක් රට පුරා ගොඩ නැගීමයි. ජනතාව පුරුදු වී ඉන්නේ සහන ලබා ගැනීමටයි. ආණ්ඩු ක්‍රියා කරන්නෙත් ජනතාවට දියුණු වීමේ අවස්ථාවන් නිර්මාණය කරන්න නෙවෙයි. සහන ලබා දීමටයි.

එක්දහස් නවසිය පණස් ගණන් සිහිපත් කරමින් වරෙක ලීක්වාන්යූ මෙන්න මෙහෙම සඳහන් කළා. "සිංගප්පූරුවේ මම දුෂ්කර, එහෙත් නිවැරදි මාවත අනුගමනය කළෙමි. ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජනප්‍රිය මාවත අනුගමනය කළේය."

මේ ජනප්‍රිය මාවතේ තව දුරටත් ඉදිරියට යෑමෙන් රටට අනාගතයක් නෑ. හැමදාමත් අනුන්ට ණය වෙමින්, සහන ලබා දුන්නා කියා රටට ඇතිවන සුගතියක් නෑ. ඉතින් අපි දැන්වත් මේ තත්වයෙන් මිදෙමු. අපේ චින්තන රටාවන් වෙනස් කරගනිමු.